**මානව සම්පත් අභිවර්ධන ආයතනය - 2017**

----------------------------------------------------------

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලියේ 23 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ දක්වා ඇති රු.316,565 ක තැන්පත් මුදල් ගලාඒම් තුළ රු.1,838,400 ක් වටිනා පුස්තකාල තැන්පතු අගයද ඇතුළත් කර තිබුණි. එසේ තිබියදී නැවත එම අගය පුස්තකාල තැන්පතු මුදල් ගලා ඒම් ලෙස කාරක ප්‍රාග්ධන වෙනස්වීම් තුළ ගැලපීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ශුද්ධ මුදල් ගලා ඒම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හා ක්‍රමක්ෂය කිරීමට ආයතනය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබූ අතර ස්ථාවර වත්කම් යටතේ වාර්ෂිකව සියයට 20 බැගින් ක්ෂයකර තිබුණද ක්ෂය අනුපාතය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. කෙසේ වුවද, ක්ෂය උපලේඛනයේ සඳහන් පරිදි වර්ෂයට අදාළ ක්ෂය රු. 252,257 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එම වටිනාකම රු. 448,257 ක් ලෙස දක්වා තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධන ප්‍රදානවලින් ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා වැයකර තිබුනේ රු.7,473,859 ක් වුවද වැය නොකළ ප්‍රාග්ධන ගිණුමෙන් වැය කළ ප්‍රාග්ධන ගිණුමට බැර කර තිබුනේ රු.7,607,891 ක් වීමෙන් වැය කළ ප්‍රාග්ධන ගිණුම රු.134,032 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ක්ෂය උපලේඛනය අනුව වාහන සඳහා වර්ෂයට අදාළ ක්ෂය වටිනාකම රු.2,949,375 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ රු.724,375 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් සඳහා ක්‍රමක්ෂය ගණනය කළ නොහැකි වුවත් ආයතනය විසින් සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර එම ප්‍රත්‍යාගණිත අගය මත නැවතත් ක්‍රමක්ෂය ගණනය කර තිබුණි. එබැවින් ක්‍රමක්ෂය අගය සහ වැයකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය නිරවද්‍ය නොවිය.

(ඇ) 2017 වර්ෂය වන විට සම්පූර්ණයෙන් ක්ෂය වී නොමැති වාහන දෙකක් සඳහා ක්‍රමක්ෂය ගිණුම් ගතකර නොතිබුණි.

(ඉ) 2017 වර්ෂයට අදාළ වූ රු.1,557,168 ක වියදම් 2018 වර්ෂයේදී ගෙවා තිබුණද මෙම අගය උපචිත වියදම් ලෙස හඳුනාගෙන නොතිබීමෙන් වර්ෂයේ අතිරික්තය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1985 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වන වගන්තිය සහ 16 වන වගන්තිය සහ 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදලේ 16 වන වගන්තිය | ආයතනයේ සේවයේ යෙදී සිටින සේවකයින් වෙනුවෙන් නියමිත දිනවලදී දායක මුදල් නොගෙවීම හේතුවෙන් පෙර වර්ෂවලට අදාලව සේවකයා විසින් ගෙවිය යුතු සියයට 8 ක දායක මුදල හා අධිභාර ලෙස එකතුව රු.8,982,751 ක් සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් ගෙවා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 110 | හානි පිළිබඳ ලේඛනයක් පවත්වාගත යුතු වුවත් එවැනි ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 371 හා 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - අත්තිකාරමක් ලබාදීම හුදෙක් මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් සීමා විය යුතු වුවත් මාණ්ඩලික නොවන නිලධාරීන් 14 දෙනෙකු වෙත අවස්ථා 179 කදී එකතු වටිනාකම රු.2,905,666 ක අත්තිකාරම් මුදලක් ලබාදී තිබුණි.<br>- අත්තිකාරම් අදාළ කාර්යය කඩිනමින් නිමකොට පියවිය යුතු වුවත් අවස්ථා 24 කදී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු.307,640 ක අත්තිකාරම් පියවීම සඳහා දින 18 සිට දින 170 ක් දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 751 හා 757 | සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව රු.758,762 ක් වටිනා ස්ථාවර වත්කම් භෞතිකව ආයතනය තුළ නොපවතින බවත් ස්ථාවර වත්කම් ලේඛනයෙහි අන්තර්ගත නොවන නමුත් වටිනාකම හඳුනානොගත් අයිතම 347 ක් භෞතිකව ආයතනය තුළ පවතින බවත් නිරීක්ෂණය විය. |
| | (iv) මුදල් රෙගුලාසි 756 (2) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කමිටුව සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද පරිගණක අයිතම සම්බන්ධ සමීක්ෂණ වාර්තාව අනුව එක් පුද්ගලයෙකුගේ සහභාගීත්වයෙන් පමණක් සමීක්ෂණය සිදුකර තිබුණි. |

| | |
|---|---|
| (v) මුදල් රෙගුලාසි 770 | 2016 සහ 2017 වර්ෂයන්හි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් භාවිතයට ගත නොහැකිව ඉවත් කිරීමට නිර්දේශ කරන ලද රු.2,859,260 ක් වටිනා භාණ්ඩ වර්ග 04 ක් විගණිත දිනය වූ 2018 ජුනි 22 දක්වාම ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඈ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන සියලුම නිලධාරීන් පැමිණීම හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 10 දෙනෙකුගේ පැමිණීම සනාථ කරගැනීමෙන් තොරව රු.36,786,564 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) 2004 ජුලි 29 දිනැති පීඊඩී/25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ පැවති රු.155,451,216 ක ස්ථාවර තැන්පතු සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඉ) 2004 ජනවාරි 26 දිනැති අංක පුස/01 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ චක්‍රලේඛය | 2017 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා රු.5,572,787 ක් වටිනා පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.42,996,700 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.61,576,424 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.18,579,724 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැටුප් හා දීමනා වියදම රු.25,094,713 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ පැවති රු.15,174,119 ක අතිරික්තය උච්ඡාවචනයන් සහිතව 2017 වර්ෂය වන විට රු.42,996,700 ක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ක්ෂය වීම් සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.49,810,791 ක්වූ ආයතනයේ දායකත්වය 2014 වර්ෂයේ රු.47,458,572 දක්වා සියයට 5 කින් පහළ ගොස් තිබුණද 2015 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.114,264,804 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

---------------

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පවත්වනු ලබන ප්‍රථම උපාධි පාඨමාලා 01 ක්(Undergraduate), පශ්චාත් උපාධි පාඨමාලා 05 ක් (Postgraduate), උසස් පාඨමාලා 07 ක් (Executive/Higher), ඩිප්ලෝමා පාඨමාලා 10 ක් (Diploma) හා සහතික පත්‍ර පාඨමාලා 22 ක් (Certificate) ලෙස සමස්ත පාඨමාලා 45 ක් පැවතුනි. නමුත් 2017 වර්ෂය වෙනුවෙන් පාඨමාලා 36 ක් සඳහා සිසුන් ලියාපදිංචි වී නොතිබූ අතර මින් පාඨමාලා 11 ක් සඳහා වසර 05 ක සිටම සිසුන් ලියාපදිංචි වී නොතිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය වන විට පාඨමාලා 45 අතුරින් පාඨමාලා 22 ක් නවතා තිබූ අතර සිසුන් බඳවා ගැනීමට අතුරු ව්‍යවස්ථා හා රෙගුලාසි අනුමත කරන තෙක් එම පාඨමාලා කල් දමා ඇති බව විගණනය වෙත දන්වා තිබුණි.

(ආ) 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 3816 කින් අඩු වී තිබූ අතර එය සියයට 52 ක අඩුවීමකි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටු කළ යුතු කාර්යභාරයන් 54 ක් පැවති අතර වර්ෂය තුළ ඉටු කිරීමට නොහැකි වූ කාර්යයන් 19 ක් පැවති බව නිරීක්ෂණය විය.

(ඈ) ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රධාන අරමුණු 07 ක් යටතේ පරමාර්ථ (Goals) හා උපායමාර්ග (Strategy) ඇතුළත් කරමින් පිළියෙල කර තිබුණද එක් අරමුණක් වෙනුවෙන් උපායමාර්ග සඳහා පමණක් අයවැය ඇස්තමේන්තුව දක්වා තිබුණි. අනෙක් අරමුණු ඉටු කිරීම සම්බන්ධයෙන් අයවැය ඇස්තමේන්තු දක්වා නොතිබුණි.

(ඉ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමග මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පිළියෙල කර නොතිබුණු අතර එහි කාර්යයන් ඉටුකළ කාලවකවානු හා වැය කළ මුදල් පිළිබඳ සඳහන්ව නොතිබුණි. එම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යභාරයන් සැලසුම් කළ කාලවකවානු වල හා ඇස්තමේන්තු වියදම් සීමාව තුළ ඉටුකරන ලද බව තහවුරු කරගැනීමට නොහැකි විය.

### 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

----------------------------

ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සංඛ්‍යාව 98 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 73 ක් වුයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 25 ක් විය. අනුමත කාර්ය මණ්ඩල තනතුරුවලට අදාල පුරප්පාඩු සඳහා ස්ථිරව නිලධාරීන් බඳවා ගැනීමකින් තොරව 2017 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම මත වැඩසටහන් සහකාරවරුන් 25 දෙනෙක්ද වැඩ සහයකවරයෙක්ද ලෙස සේවකයින් 26 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින් කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳ දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 04 දින ඉදිරිපත් කර තිබුණි.

### 6.2 ප්‍රසම්පාදනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 4.2.1 ඡේදය පරිදි ප්‍රසම්පාදන සැලැස්මෙහි ඊළඟ වර්ෂය සඳහා ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කර නොතිබූ අතර සැලැස්මෙහි ඇති වන වෙනස්කම් සමාලෝචනය කර නිතිපතා යාවත්කාලීන කරද නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් රු.13,635,350 ක් වටිනා භාණ්ඩ, වැඩ හා සේවා 08 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණු අතර ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් නොවූ රු.974,562 ක් වටිනා කාර්යයන් 12 ක් ඉටුකර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් ප්‍රසම්පාදන කාර්යයන් දෙකක් සඳහා ඇස්තමේන්තුගත වටිනාකම ඉක්මවා රු.3,444,809 ක මුදලක් වැය කර තිබූ අතර එහි විචලනය සියයට 134 ක් විය.

### 6.3 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තත්‍ය අගයන් සැසඳීමේදී ආදායම රු.72,363,395 කින් එනම් සියයට 44 කින් විචලනය වී තිබූ අතර වෙනත් මෙහෙයුම් වියදම රු.45,902,486 කින් එනම් සියයට 94 කින් විචලනය වී තිබුණි.

### 6.4 අභ්‍යන්තර විගණනය

කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අභ්‍යන්තර විගණනය සිදුකර තිබුණි. 2017 වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව 2017 වර්ෂය තුළ ආයතනයේ විෂයයන් 13 ක් විගණනය සඳහා සැලසුම් කර තිබුණද ඉන් විෂයයන් දෙකක් පමණක් විගණනය කර තිබීමෙන් ආයතනයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.

## 6.5 නොවිසඳී ඇති විගණන ඡේද

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් 2014 වර්ෂයේදී මාධ්‍ය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කර තිබුණද මෙම පාඨමාලා පැවැත්වීම සඳහා ආයතනයේ විශේෂඥ දැනුමක් ඇති ආචාර්යවරුන් නොසිටි බැවින් 2014 වර්ෂයෙන් පසු පාඨමාලාව සඳහා සිසුන් බඳවාගෙන නොතිබුණි.

(ආ) 2014 ජුනි 01 දින කොළඹ විශ්වවිද්‍යාලයේ නව කලාගාරයේ පැවති ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සවය සඳහා භාවිතා කරන ලද ආයතනයට අයත් රු.69,900 ක් වටිනා ලැප්ටොප් පරිගණයක් අස්ථානගත වී තිබු අතර ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා ආයතනයට සිදු වූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන කටයුතු සඳහා ඉදිකර තිබූ ගොඩනැගිල්ල පිහිටි පර්චස් 27.86 ක් වූ ඉඩම කොළඹ විශ්වවිද්‍යාලය සතු වන අතර එම ඉඩමෙහි අයිතිය පවරාගෙන වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | අයවැය පාලනය | අයවැය වරින්වර සමාලෝචනය කර ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා නොගැනීම. |
| (ආ) | ආයෝජන කළමනාකරණය | ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගැනීම. |
| (ඇ) | ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීනව පවත්වා නොගැනීම |
| (ඈ) | වාහන පාලනය | වාහනවල ඉන්ධන පාරිභෝජනය පිළිබඳ පරීක්ෂා නොකිරීම, වාහන සම්බන්ධ විස්තර ඇතුලත් ලේඛනයක් පවත්වා නොගැනීම, වාහන සම්බන්ධ සමීක්ෂණ සිදු නොකිරීම, ධාවන් සටහන් සහ ගමන් පිළිබඳ මාසික සාරාංශ වාර්තා වල තොරතුරු ඇතුලත් නොකිරීම. |
| (ඉ) | පාඨමාලා පවත්වාගෙන යාම | අතුරු ව්‍යවස්ථා සහ රෙගුලාසි අනුමත කර නොගෙන පාඨමාලා ආරම්භ කර තිබීම. |